සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය** **ඉතිහාසය - I** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි ඃ
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (i), (ii), (iii) සහ (iv) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දි ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.


---

01. මහාවංශයේ මුල් කොටසේ තොරතුරු අයත් කාල පරාසය වන්නේ මින් කුමක් ද?
(1) මහින්දාගමනයේ සිට මහසෙන් රාජ්‍ය සමය දක්වා ඓතිහාසික තොරතුරුය.
(2) බුදුන්වහන්සේගේ ලංකාගමනයේ සිට මහසෙන් රාජ්‍ය කාලය අවසානය දක්වා තොරතුරුය.
(3) ධාතුසේන රාජ්‍යය සමයේ සිට පළමුවන පැරකුම් කාලය දක්වා තොරතුරුය.
(4) පොළොන්නරුව යුගයේ අවසානය දක්වා තොරතුරුය.

02. මෙරට පැරණි බ්‍රාහ්මීය ලිපිවල සඳහන්වන ප්‍රධානම තොරතුරු ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) භික්ෂූන් වහන්සේලාට ලෙන් පිදීම. (2) ජනතාවගෙන් බදු අය කිරීම.
(3) විහාර පාලනය පිළිබඳව. (4) වැරදිකරුවන්ට සමාව දීම පිළිබඳව.

03. බුලත්සිංහල කුරුවිට වැනි ප්‍රදේශවල පිහිටි ලෙන් වැදගත් වන්නේ ඒවා,
(1) අනුරපුර පොළොන්නරු යුගවලදී ආරක්ෂිත ස්ථාන වීම නිසාය.
(2) පැරණි බෞද්ධාරාමලෙස පැවතීම නිසාය.
(3) බ්‍රාහ්මීය අක්ෂර ලිපි ලිවීම සඳහා යොදාගෙන ඇති නිසාය.
(4) ප්‍රාග් ඓතිහාසික මානවයන්ගේ ජීවන තොරතුරු වලට අදාල සාධක හමුවන නිසාය.

04. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ කැණීම්කරන ස්ථානයක් සිතියමේ A අක්ෂරයෙන් දක්වේ. එය කුමක් ද?
(1) දියවින්න
(2) මාතොට
(3) අළුගල්ගේ
(4) අළුලෙන




05. වංශකතාවල හා සෙල්ලිපි වල සඳහන්වන ආකාරයට වෘත්තිකයින් විසූ ගමක් අඩංගු පිළිතුර වන්නේ මින් කුමක් ද?
(1) පට්ටනගාම (2) ඔලගම් (3) කසිකාරගාම (4) නියම්ගම්

06. පරුමුකවරුන්ට ප්‍රාදේශීය බලයක් හිමිව තිබූ බවට පෙන්වාදීමට හැකි සෙල්ලිපිය වන්නේ මින් කුමක් ද?
(1) කොත්ගල්කන්ද සෙල් ලිපිය (2) පෙරියපුලියන්කුලම සෙල් ලිපිය
(3) කොණ්ඩවට්ටවාන් සෙල් ලිපිය (4) සිතුල්පව්ව සෙල් ලිපිය

07. තමන්ගේ දසවෙනි රාජවර්ෂයේ දී ග්‍රාමසීමා ලකුණු කළ රජු වන්නේ කවරෙක් ද?
(1) දුටුගැමුණු රජු (2) මහපැරකුම් රජු (3) ධාතුසේන රජු (4) පණ්ඩුකාභය රජු

08. ශ්‍රී ලංකාවේ පැරණි පාලන සංවිධානයක සභාව යනුවෙන් හැඳින්වූයේ මින් කුමක් ද?
(1) ව්‍යවස්ථාදායකය (2) අධිකරණය (3) විධායකය (4) ලේඛක මණ්ඩලය

09. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් වෙහෙරකෙම සෙල්ලිපියේ සඳහන් 'තතවය' යන වචනයෙන් අදහස් කළේ කුමන කර්මාන්තය ද?
(1) මැටි භාජන නිපදවීමේ කර්මාන්තය (2) තඹ නිෂ්පාදන කර්මාන්තය
(3) ඇත්දත් නිෂ්පාදන කර්මාන්තය (4) රෙදි විවීමේ කර්මාන්තය

10. සීගිරි පර්වතයේ ඉහළ සිට පහළට එන ජල පහර අඩු බෑස්මකින් ගලා යාමට හැකිවන සේ කාණු දඟරාකාරව සකස් කළේ කුමන කාරණයක් සඳහා ද?
(1) රොන්මඩ ස්වභාවික ගුරුත්ව බලයෙන් පහළට ගෙන යාමටය.
(2) ජල පහරේ වේගය අඩු කිරීමටය.
(3) ජල පහරේ පීඩනය වැඩි කිරීමටය.
(4) ජලමල් ක්‍රියාත්මක වීමටය.

11. රූපයේ දැක්වෙන්නේ රෝහල්වල සැත්කම් සඳහා භාවිතා කරන ලෝහ කතුරු කිහිපයකි. මේවා හමුවූ ස්ථානය කුමක් ද?
(1) පොළොන්නරුවේ ආලාහන පිරිවෙනෙන්
(2) අභයගිරි විහාර භූමියෙන්
(3) ඉබ්බන් කටුවෙන්
(4) අළකොළ වැව ප්‍රදේශයෙන්



12. පැරණි කාලයේදී මැනීමට භාවිතා කළ කුඩාම මිනුම වූයේ කුමක් ද?
(1) ආංගුලය (2) පරමාණුව (3) තජ්ජාර (4) වියත

13. ඓතිහාසික යුගයේ සමාජ සංවිධානයේ දී 'රද්කොල් සම්දරු' ලෙස සෙල්ලිපි වල සඳහන් වන්නේ කුමන නිලධාරීන් ද?
(1) රජුට සමීප රාජකීය නිලධාරීන් (2) යුධ හමුදාව භාර සේනාපතිවරයා
(3) රාජ භාණ්ඩාගාරය භාර වූ නිලධාරියා (4) ධනවත් වෙළෙඳ ප්‍රධානීන්

14. පැරණි සමාජයේ ප්‍රභුවරුන්ගේ මට්ටමට පහළින් සිටි සාමාන්‍ය ජනතාව සෙල්ලිපිවල සඳහන්ව ඇත්තේ කුමන ආකාරයට ද?
(1) එඬේරුන් (2) කුඩීන් (3) අබලවපර (4) මැණික් කපන්නන්

15. අග්නිදිග ආසියාතික මලය අර්ධද්වීපයෙන් පැමිණි චන්ද්‍රභානු ආක්‍රමණිකයාගේ අරමුණ වූයේ?
(1) රාජ්‍ය බලය ලබා ගැනීම (2) රජු විනාශ කිරීම
(3) බෞද්ධ පූජනීය වස්තු සොරා ගැනීම (4) වෙළෙඳපොළ පාලනය කිරීම

16. මව් පාර්ශවයේ රාජ්‍ය උරුම වීමේ ක්‍රමය දක්නට ලැබෙන්නේ කුමන රාජ්‍ය සමයකද?
(1) දඹදෙනි යුගයේ (2) කෝට්ටේ යුගයේ (3) යාපහු යුගයේ (4) ගම්පොළ යුගයේ

17. පහත තොරතුරු ඇසුරින් විමලධර්මසූරිය රජුට පමණක් අදාල වන පිළිතුරු තෝරන්න.
A - කුසුමාසන දේවිය විවාහර කර ගැනීම.
B - දන්තුරේ සටනින් පෘතුගීසීන් අන්ත පරාජයකට ලක් කිරීම.
C - රන්දෙනිවල සටනට නායකත්වය ලබාදීම.
D - පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම.
(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

18. උඩරට රාජධානියට වෙරළ තීරයක් අහිමි කරමින් උඩරට සාම්ප්‍රදායික වෙළඳාමට බාධා කරමින් 1766 ගිවිසුම අත්සන් කළේ කුමන කණ්ඩායම් අතරද?
(1) ලන්දේසීන් හා ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (2) පෘතුගීසීන් හා දෙවන රාජසිංහ රජු
(3) ලන්දේසීන් හා කීර්ති ශ්‍රී රාජසිංහ රජු (4) ඉංග්‍රීසීන් හා කීර්ති ශ්‍රී රාජසිංහ රජු

- **පහත වගුවේ A සිට L දක්වා තොරතුරු ඇසුරින් 19, 20 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| අදාළ රට | විද්‍යාඥයා | සොයා ගැනීම |
|---|---|---|
| A. පෝලන්තය | E. ජොහැන්ස් කෙප්ලර් | I. දුරදක්නය |
| B. එංගලන්තය | F. ගැලීලියෝ ගැලීලි | J. පෘථිවිය ගෝලාකාර බව |
| C. ජර්මනිය | G. අයිසෙක් නිව්ටන් | K. ග්‍රහලෝක ඉලිප්සාකාර ගමන් මගක යාම |
| D. ඉතාලිය | H. නිකලස් කොපර්නිකස් | L. ගුරුත්වාකර්ෂණය |

19. ඉහත වගුව අධ්‍යයනය කර ගුරුත්වාකර්ෂණ නියමයට අදාල පිළිතුර තෝරන්න.
(1) BGL (2) BEI (3) CGL (4) BGJ

20. ජොහැන්ස් කෙප්ලර් හා සම්බන්ධ ප්‍රකාශ ඇතුලත් පිළිතුර තෝරන්න.
(1) CFK (2) CEK (3) AIL (4) AJK

21. 1505 පෘතුගාලයේ රජු විසින් පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා ලෙස පත්කර එව්වේ?
(1) ප්‍රැන්සිස්කෝ ද අල්මේදා (2) ලොරොන්සෝ ද අල්මේදා
(3) දියෝගු ද මේලෝ (4) කොන්ස්තන්තිනුද සා

22. පෘතුගීසීන් හා යාපන රාජ්‍ය අතර ගැටුම් ඇතිවීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,
(1) සංකිලි රජුගේ කාලයේදී පෘතුගීසි වෙළඳ නැව් වලට බාධා එල්ල වීමය.
(2) මන්නාරම් අවට ප්‍රදේශවලින් මුතු කිමිදීමෙන් පෘතුගීසීන් ලද ආදායම අහිමි වීමය.
(3) කුරුඳු ගම්මිරිස් වැනි වෙළඳ ද්‍රව්‍ය යාපන ප්‍රදේශයෙන් ලබා ගැනීමේදී බාධා එල්ල වීමය.
(4) වීදිය බණ්ඩාර යාපනයට පලාගිය අවස්ථාවේ සංකිලි රජු ඔහු පිළිගැනීමය.

23. මහනුවර රාජධානියේ නිත්‍යානුකූල අයිතිය ඉංග්‍රීසීන් විසින් තහවුරු කරගනු ලැබුවේ,
(1) රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩු කාරවරයාගේ ආක්‍රමණය මගිනි.
(2) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අල්ලා ගැනීමෙනි.
(3) 1815 උඩරට ගිවිසුම මගිනි.
(4) 1818 ප්‍රකාශය නිකුත් කිරීම මගිනි.

- **පහත සඳහන් වගුවේ A සිට J දක්වා තොරතුරු ඇසුරින් හා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| වර්ෂය | බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු | ස්වදේශික නායකයා |
|---|---|---|
| A. 1803 | D. ටොරිංටන් සාමි | G. ගොංගාලේගොඩ බණ්ඩා |
| B. 1818 | E. ෆෙඩ්රික් නෝර්ත් | H. කැප්පටිපොළ |
| C. 1848 | F. රොබට් බ්‍රවුන්රිග් | J. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා |

24. මැක්ඩෝවෙල් සෙන්පතියා යටතේ උඩරට ආක්‍රමණය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) AEJ (2) AFG (3) BFH (4) CDJ

25. බ්‍රිතාන්‍යයන්ගේ පාලනයට විරුද්ධව මෙහෙය වූ ප්‍රථම නිදහස් සටන හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) ADG (2) BEJ (3) BFH (4) CFJ

26. බෞද්ධ පූජනීය ස්ථාන රැක ගැනීමේ ව්‍යාපාරයේ දී දේශීය ජනතාව දැනුවත් කළ යුරෝපීය උගතුන් අඩංගු පිළිතුර තෝරන්න.
A - ජෝර්ජ් ටර්නර් මහතා B - අනගාරික ධර්මපාල තුමා
C - හෙන්රි ඕල්කට් තුමා D - හෙන්රි පාකර් මහතා
(1) B හා C (2) C හා D (3) A හා D (4) A හා B

27. පහත සඳහන් ප්‍රකාශ අධ්‍යයනය කර බ්‍රිතාන්‍ය පාලනයේ අයහපත් බලපෑම් ඇතුළත් ප්‍රකාශ සහිත පිළිතුර තෝරන්න.
A - ජාත්‍යන්තර භාෂාවක් වූ ඉංග්‍රීසි භාෂාව ලැබීම.
B - ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම.
C - කාර්මික විප්ලවයේ බලපෑම් ලැබීම.
D - බටහිර සංස්කෘතියේ අංග රටපුරා පැතිරවීම.
(1) C හා D (2) A හා B (3) B හා C (4) B හා D

- **පහත සඳහන් A, B, C, D ලෙස දක්වා ඇති යුගල අධ්‍යනය කර 28, 29, 30 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A 1. ලුණු හා කුරුඳු ඒකාධිකාරය අහෝසි කිරීම.
2. පෞද්ගලික අංශයේ ව්‍යාපාරවල යෙදීම.

B 1. කෝපි වගාව
2. හැමිලියා වෙස්ටර්ට්‍රික්ස්

C 1. තේ වගාව
2. ලූල් කඳුර වතු යාය

D 1. පොල් වගාව
2. ජේම්ස් ටේලර්

28. පළමුවැන්න නිසා දෙවැන්න වර්ධනය පෙන්වන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

29. පළමුවැන්න හා දෙවැන්න අතර කිසිඳු සම්බන්ධයක් නැති යුගල කුමක් ද?
(1) A (2) B (3) C (4) D

30. දෙවැන්න පළමුවැන්නේ විනාශයට හේතු වූ බව පෙන්වන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

31. 1919 වර්ෂයේදී ලංකා ජාතික සංගමය පිහිටුවීමට සිංහල නායකයින් සමඟ සහයෝගයෙන් කටයුතු කළ ජන නායකයා,
(1) පොන්නම්බලම් රාමනාදන් මහතාය. (2) අරුමුගනාවලර් තුමාය.
(3) ඇම්.සී. සිද්දලෙබ්බේ මහතාය. (4) පොන්නම්බලම් අරුණාචලම් මහතාය.

32. සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වූයේ,
(1) ජනාධිපතිතුමාය (2) කථානායකතුමාය (3) අග්‍රාණ්ඩුකාරවරයාය (4) අගමැතිවරයාය

- **පහත සඳහන් A හා B ප්‍රකාශ කියවා 33, 34 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
(A) මුද්දර පනත (B) ගැබෙල් බද්ද

33. මෙම ප්‍රකාශ අතරින් ඇමරිකානු නිදහස් සටන සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර තෝරන්න.
(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

34. ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන් සත්‍ය පිළිතුර තෝරන්න.
(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

35. පහත දැක්වෙන ජලාශ අතරින් ස්වීඩන් හා ජර්මන් රජයේ ආධාරයෙන් ඉදිකරන ලද ජලාශ යුගලය වන්නේ,
A - වික්ටෝරියා B - කොත්මලේ C - රන්දෙණිගල D - මාදුරුඔය
(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

36. 'අ' තීරයේ දක්වා ඇති ප්‍රකාශන හා 'ආ' තීරුවේ ඓතිහාසික සිද්ධීන් හා නිවැරදිව ගලපා ඇති පිළිතුර කුමක් ද?

| 'අ' | 'ආ' |
|---|---|
| 1. බොස්ටන් තේ සාදය | A - පළමු ලෝක යුද්ධය |
| 2. සමාජවාදී දර්ශනය පිළිගත් රටක් බිහිවීම | B - ඇමරිකානු විප්ලවය |
| 3. ප්‍රාන්ස් පර්ඩිනන් හා ඔහුගේ බිරිඳ ඝාතනය | C - රුසියන් විප්ලවය |
| 4. පර්ල් වරායට පහරදීම | D - දෙවන ලෝක යුද්ධය |
| | E - ප්‍රංශ විප්ලවය |

(1) ABCD (2) AEDC (3) BCAD (4) CBDA

37. ජාතීන්ගේ සංගමය හා සම්බන්ධ පහත A හා B ප්‍රකාශ අධ්‍යනය කර නිවැරදි පිළිතුර තෝරන්න.
(A) සූවස් අර්බුදය (B) ඉතාලිය ඇබිසීනියාව ආක්‍රමණය කිරීම
(1) A හා B සත්‍ය වේ. (2) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(3) A අසත්‍ය වන අතර B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

38. දෙවන ලෝක මහා සංග්‍රමයේදී හිට්ලර් ලැබූ දරුණුතම හා තීරණාත්මක පරාජය ළඟා වූයේ මින් කවර රටක් ආක්‍රමණය කිරීමට යාමේදී ද?
(1) රුසියාව (2) පෝලන්තය (3) එංගලන්තය (4) බෙල්ජියම

39. ''අපි ආයුධ බලයෙන් වසර 05 දී ලබාගත් දේ ආරක්ෂා කර ගැනීමට තවත් වසර 50 ක් සන්නද්ධව සිටිය යුතුය.'' යැයි ප්‍රකාශ කළේ කවුද?
(1) වෝන් වෝල්ක් (2) බිස්මාර්ක් (3) දෙවන විලියම් (4) ලොයිඩ් ජෝර්ජ්

40. අනාගත ලෝක මහා සංග්‍රාමයකින් ඇතිවිය හැකි ප්‍රතිඵලය මින් කුමක් විය හැකිද?
(1) යුධ කටයුතුවලදී රොබෝ තාක්ෂණය භාවිත කළ හැකි බැවින් ජීව ලෝකයෙහි විශාල ප්‍රමාණයක් වැනසෙනු ඇත.
(2) යුද්ධයේදී න්‍යෂ්ටික අවි භාවිත කළ හැකි බැවින් ජීව ලෝකයෙන් විශාල ප්‍රමාණයක් වැනසෙනු ඇත.
(3) සංවර්ධිත රටවල් වැඩි ගණනක් විනාශ වී යනු ඇත.
(4) සංවර්ධනය වෙමින් පවතින රටවල් වැඩි ගණනක් විනාශ වී යනු ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය** | **ඉතිහාසය - II** | **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න 4 ක් ද, **III** කොටසින් එක් ප්‍රශ්නයක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I - කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.

(i) දේව නගර, දඹකොළ පටුන, මැණික් ගඟ, යාන් ඔය, මීගමුව, ගන්නෝරුව, සේනානායක සමුද්‍රය, තබ්බෝව වැව, පාහියංගල, පොතාන, කල්පිටිය, මාතොට (ල.12)

(ii) ප්ලෝරන්ස්, කළු මුහුද, දකුණු කොරියාව, මලය අර්ධද්වීපය, ගෝව, සූවස් ඇළ (ල.06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාල පිළිතුරු ලියන්න.

A එකළ වත්සිරිත් හා චාරිත්‍ර පිළිබඳ අධිකාරිවරයා හැඳින්වූ නම කුමක් ද?

B ගම්පළ රාජධානි සමයේ ශ්‍රී ලංකාවට පැමිණි චීන සෙන්පතියා කවුද?

C දන්ත ධාතුන් වහන්සේ ලංකාවට වැඩම කළ නැගෙනහිර වෙරළේ පිහිටි නැව්තොට කුමක් ද?

D ''නීතියේ සාරය'' නම් කෘතිය ලියා ප්‍රංශ විප්ලයට දාර්ශනික මතවාද එක් කළ දාර්ශනිකයා. (ල.04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

(ii) 1. A වලින් දැක්වෙන නිර්මාණය කුමක් ද?

2. එය ඉදිකළේ කුමන ඔයක් සම්බන්ධ කරගෙන ද?

3. මෙම නිර්මාණය දක්නට ලැබෙන්නේ කුමන රාජධානියේ ද?

4. අතීත මහා මාර්ග ඉංජිනේරුවන් මෙම නිර්මාණයට භාවිත කළ ද්‍රව්‍ය 01 ක් නම් කරන්න. (ල.04)



A

(iii) 1. B පින්තූරයේ දැක්වෙන පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.

2. ඔහු නායකත්වය දුන් දේශපාලන විප්ලවය කුමක් ද?

3. ඔහු පිහිටුවාගත් දේශපාලන පක්ෂය කුමක් ද?

4. ඔහු අනුගමනය කළ දේශපාලන දර්ශනය කුමක් ද? (ල.04)



B

---

## II - කොටස

(02) (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ වෙරළාසන්න එළිමහන් වාසස්ථාන 03 ක් නම් කරන්න. (ල.03)

(ii) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය ඊට පෙර පැවති ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්කර හඳුනාගත හැකි ලක්ෂණ 04 ක් ලියන්න. (ල.04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ සංස්කෘතිය හැදෑරීමට ඇති හොඳම සාක්ෂියක් ලෙස මහා ශිලා සුසාන හැඳින්විය හැකිය. එවැනි මහා ශිලා සුසාන සම්ප්‍රදායට අයත් සුසාන වර්ග 02 ක් නම් කර ඒවා නිර්මාණය කර ඇති ආකාරය හා ව්‍යාප්ත වූ ප්‍රදේශ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ ප්‍රධාන සාධකයක් වූයේ භූ භෞතික පසුබිමයි. එවැනි භෞතික සාධක 03 ක් ඇසුරින් එය පැහැදිලි කරන්න. (ල.06)

(03) (i) පහත සඳහන් ප්‍රකාශ හා සම්බන්ධ සෙල්ලිපි වරහන තුළින් තෝරා පිළිවෙලින් ලියන්න. (ල.03)

A - පරුමකවරුන්ට ප්‍රාදේශීය පාලන බලයක් පැවති බව සඳහන්වන සෙල්ලිපිය.

B - ගෘහපතියෙකු විසින් භික්ෂූන් වහන්සේලාට සැප පහසු ගල්ගුහාවක් පූජා කළ බව සඳහන් වන සෙල්ලිපිය.

C - දානය පූජා කිරීමේදී ගැටලුකාරී තත්වයක් පැන නැගුණහොත් දසගම් ඇත්තන් රැස් විය යුතු බව දැක්වෙන සෙල්ලිපිය.

(පෙරියපුලියන් කුලම, කොත්ගල් කන්ද, සොරබොරවැව, කළුදිය පොකුණ)

(ii) පහත සඳහන් එක් එක් කරුණ හා සම්බන්ධ පාලකයින් නම් කරන්න.

A - පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට චේර රාජ්‍යට ගිය ලම්භකර්ණ වංශික රජතුමා.

B - විසිවතාවක් ශ්‍රී ලංකාවෙන් චීනයට රාජ්‍ය තාන්ත්‍රික දූත ගමන් යෙදුණු රජතුමා.

C - උපසග්ග රෝගනාස නම් රෝහල ඉදිකළ රජතුමා.

D - ගැබිණි මව්වරුන් සඳහා පසවන්ති නාම ශාලා නම් මාතෘ නිවාස ඉදිකළ රජතුමා. (ල.04)

(iii) පළමුවන විජයබාහු රජතුමා මෙරට ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයකු බව කරුණු 02 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.05)

(iv) පැරණි ශ්‍රී ලාංකික සමාජය තුළ උසස් වාර්ගික සහජීවනයක් පැවැති බව උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.06)

(04) (i) පහත සඳහන් වැව් ඉදිකළ රජවරු පිළිවෙලින් නම් කරන්න.

A - අභය වැව

B - මින්නේරිය වැව

C - කලා වැව (ල.03)

(ii) පහත සඳහන් ABCD යටතේ දක්වා ඇති තොරතුරු වලට අදාල පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියන්න. (ල.04)

A - අඹන් ගඟ හරස්කර ඉදිකළ ඇළ මාර්ගය.

B - කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙනයාමට ඉදිකළ ඇළ මාර්ගය.

C - මහියංගණයට දකුණු දෙසින් මහවැලි ගඟ හරස්කොට තැනූ අමුණ.

D - මැටි බඳුන් ළිඳ තුළට බස්සවා බිත්ති ආවරණය කර සාදාගත් ළිං විශේෂය.

(උෟර කැට ළිං / යෝධ ඇළ / ඇළහැර ඇළ / මිණිපේ ඇළ / ආඩියා ළිං)

(iii) පැරණි ශ්‍රී ලංකාවේ (රජරට ශිෂ්ටාචාරයේ) ජල කළමනාකරන තාක්‍ෂණයේ විශිෂ්ටත්වය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.05)

(iv) ඓතිහාසික යුගයේ පරිසර සංරක්ෂණය පිළිබඳව පාලකයින් දැඩි අවධානයක් යොමුකර ඇති බව කරුණු 03 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.06)

(05) (i) පහත A, B, C යටතේ දක්වා ඇති කාර්යය හා සම්බන්ධ පාලකයන් කවුරුන්දැයි අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A - චන්ද්‍රභානු නම් ජාවක ආක්‍රමණිකයා පරාජය කළ දඹදෙනි පාලකයා.

B - ඊජිප්තු සුල්තාන් වරයා සමඟ වෙළඳ සම්බන්ධතා පැවැත්වූ යාපහුවේ රජු.

C - යාපනය රාජ්‍යය ආර්ය චක්‍රවර්තීන්ගෙන් මුදවා ගැනීමට සපුමල් කුමරු යැවූ කෝට්ටේ සිටි පාලකයා. (ල.03)

(ii) A. දඹදෙනි යුගයේ රචිත භික්ෂූන් වහන්සේලාගේ විනය නීති සංග්‍රහයත්, දෙවන පැරකුම්ගේ දින චර්යාවත්, පිළිබඳ ලියැවුණු කෘති දෙක නම්කරන්න.

B. කෝට්ටේ යුගයේ සාහිත්‍ය දියුණුවට මහත් සේවාවක් සිදුකළ පිරිවෙන් 02 ක් සඳහන් කරන්න. (ල.04)

(iii) දෙවන නාගරීකරණ යුගයේ ආර්ථික රටාව තුළ දැකිය හැකි ලක්‍ෂණ 02 නම් කර පැහැදිලි කරන්න. (ල.05)

(iv) කෝට්ටේ යුගය සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වීමට බලපෑ සාධක 03 ක් දක්වා උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ල.06)

(06) (i) මහනුවර රාජධානියේ දී රජතුමා විසින්ම විසඳන ලද නඩු වර්ග 03 ක් නම් කරන්න. (ල.03)

(ii) පහත A, B, C, D යන ප්‍රකාශ වලට සම්බන්ධ බදු වර්ග හැඳින්වූයේ කවර නම් වලින්දැයි ඉදිරියෙන් ලියන්න.

A - ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් අය කළ බද්ද

B - ඇතුන් ඇල්ලීම සම්බන්ධයෙන් අය කළ බද්ද

C - රෙදි විවීම සම්බන්ධයෙන් අය කළ බද්ද

D - වළං තැනීම සම්බන්ධයෙන් අය කළ බද්ද (ල.04)

(iii) දෙවන රාජසිංහ රජතුමා මුහුණ දුන් අභියෝග 02 ක් නම් කර පැහැදිලි කරන්න. (ල.05)

(iv) පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු කරුණු 03 ක් ඇසුරින් විස්තර කරන්න. (ල.06)

(07) (i) බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ගෙන ගිය පාලන ක්‍රම 03 නම් කරන්න. (ල.03)

(ii) පහත A, B, C, D ප්‍රකාශ හා සම්බන්ධ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිවෙලින් ලියන්න.

A - ව්‍යවස්ථාදායක විධායක සභා පිහිටුවීම.

B - රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම.

C - ජාතික රාජ්‍ය සභාව ස්ථාපිත කිරීම.

D - විධායක ජනාධිපති ධූරය ඇති කිරීම. (ල.04)

(iii) නිදහසින් පසු ව්‍යාපාරික කෘෂිකර්මය වැඩි දියුණු කිරීමට ගන්නා ලද පියවර අතර ඉඩම් ප්‍රතිසංස්කරණය වැදගත් විය. එසේ ගන්නා ලද ඉඩම් ප්‍රතිසංස්කරණ 02 පැහැදිලි කරන්න. (ල.05)

(iv) නිදහසින් පසු සමාජ සුබසාධනය සඳහා ගන්නා ලද පියවර 03 ක් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ල.06)

---

## III - කොටස

(08) (i) පහත සඳහන් වන්නේ කාර්මික විප්ලවය සමයේ විවිධ කර්මාන්ත ක්ෂේත්‍ර වල දියුණුවට හේතු වූ නිමැවුම් කිහිපයකි. එම නිමැවුම් වලට අදාල කර්මාන්ත ලියන්න.

A - ජෝන් කේගේ දුවන නඩාව

B - හෙන්රි කෝට්ගේ රෝලර් යන්ත්‍රය

C - හම්ප්‍රි ඩේවි ගේ ආරක්ෂක ලාම්පුව (ල.03)

(ii) කාර්මික විප්ලවයට සමගාමීව කෘෂි ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් ඇතිවීමට බලපෑ සාධක 04 ක් පහත දැක්වේ. එම සාධක වලට අදාලව කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ කළ නව නිර්මාණ මොනවාදැයි වරහන් තුළින් තෝරන්න.

A - මහා පරිමාණ ගොවිබිම් ආරම්භ කිරීම

B - ශෂ්‍ය මාරු ක්‍රමය

C - සත්ව පාලනයට නව තාක්ෂණය යොදා ගැනීම

D - නව කෘෂිකර්ම ක්‍රම හා උපකරණ භාවිතය

(ජේත් රෝටල්ගේ පේලියට බීජ වැපිරීමේ ක්‍රමය / ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය / රොබට් බැලැක් වෙල්ගෙ බැටළු අභිජනනය / ගුවානෝ පොහොර නිෂ්පාදනය / නවීන ගබඩා පහසුකම්) (ල.04)

(iii) කාර්මික විප්ලවය නිසා සමාජ ක්ෂේත්‍රයට සිදු වූ යහපත් බලපෑම් එකක් හා අයහපත් බලපෑම් එකක් නම්කර පැහැදිලි කරන්න. (ල.05)

(iv) ශ්‍රී ලංකාවට කාර්මික විප්ලවයේ බලපෑම සිදු වූ ආකාරය පහත ක්ෂේත්‍ර යටතේ විස්තර කරන්න.

A - වතු වගාව

B - ප්‍රවාහනය

C - තැපැල් සේවය (ල.06)

(09) (i) පළමුවන ලෝක යුද්ධයේ මිත්‍ර පාර්ශවයට අයත් රටවල් 03 ක් වරහන් තුළින් තෝරා ලියන්න. (ල.03)

(බ්‍රිතාන්‍යය / බල්ගේරියාව / තුර්කිය / ප්‍රංශය / රුසියාව / ඔස්ට්‍රියාව)

(ii) පහත A, B, C, D වලින් දැක්වෙන එක් එක් කරුණට අදාල පිළිතුරු අනුපිළිවෙලින් දක්වන්න.

A - පළමු ලෝක යුද්ධයේ මිත්‍ර පක්ෂයේ නායකත්වය ගත් බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍යවරයා

B - මධ්‍ය බලවතුන්ගේ පිළේ සිට රහස් ගිවිසුමක් මඟින් මිත්‍ර පිලට එක් වූ රට

C - සර්බියාවේදී ඝාතනයට ලක්වූ ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු

D - ජර්මන් සබ්මැරීනයක් මගින් ගිල්වූ ඇමරිකානු මඟීන් රැගත් නෞකාව (ල.04)

(iii) පළමුවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල 02 ක් දක්වා පැහැදිලි කරන්න. (ල.05)

(iv) දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු බිහි වූ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලෝක සාමය සඳහා ගත් ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ල.06)

(01) (අ) (i) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා සිතියම



(01) (අ) (ii) ප්‍රශ්නයට අදාළ ලෝක සිතියම




**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 - (1) | 2 - (1) | 3 - (4) | 4 - (4) | 5 - (3) | 6 - (1) | 7 - (4) | 8 - (2) | 9 - (4) | 10 - (1) |
| 11 - (1) | 12 - (2) | 13 - (1) | 14 - (2) | 15 - (3) | 16 - (4) | 17 - (1) | 18 - (3) | 19 - (1) | 20 - (2) |
| 21 - (1) | 22 - (1) | 23 - (3) | 24 - (1) | 25 - (3) | 26 - (3) | 27 - (4) | 28 - (1) | 29 - (4) | 30 - (2) |
| 31 - (4) | 32 - (4) | 33 - (1) | 34 - (2) | 35 - (3) | 36 - (3) | 37 - (3) | 38 - (1) | 39 - (1) | 40 - (2) |


(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II කොටස**

(01) (අ) (i)




(ii)



## I - කොටස

(01) (ආ) (i) A කොතුරු ගෑනා B චෙංහෝ සෙන්පතියා
C ලංකා පට්ටන D මොන්ටෙක්ස්ක්‍යු (ල.04)

(ii) 1. ගල් පාලම 2. මල්වතු ඔය
3. අනුරාධපුරයේ 4. කළුගල් (ල.04)

(iii) 1. V.I. ලෙනින් 2. රුසියන් විප්ලවය
3. බෝල්ෂෙවික් ලෙනින් පක්ෂය 4. සමාජවාදය (ල.04)

## II - කොටස

(02) (i) වෙරළාසන්න එළිමහන් වාසස්ථාන - මිනිහාගල්කන්ද / බූන්දල / පතිරාජවෙල (ල.03)

(ii)
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි
- පිළිස්සූ මැටි වළං භාවිත කිරීම
- ගල්මෙවලම් තාක්ෂණය වෙනුවට ලෝහ භාවිතය ඇරඹීම
- ස්ථිර ජනාවාස ඉදිකිරීම
- කෘෂිකර්මාන්තය ඇරඹීම (ල.04)

(iii) ශිලා මංජුසා සොහොන් / හරණි සුසාන / මැටි ඔරු සුසාන
- ශිලා මංජුසා සොහොන් :- ශිලා මංජුසා සාදා ඇත්තේ ගල්පතුරු එක්තැන් කර චතුරස්‍රාකාර හැඩයකට සකසා ගල්පුවරුවකින් ආවරණය කිරීම. එහි ඇතුළත භෂ්මාවශේෂ සහිත මැටි බඳුන් තැන්පත් කර ඇත. (උදාහරණ - ඉබ්බන්කටුව, යාපහුව, ගල්සොහොන් කනත්ත, යටිගල් පොත්ත)
- හරණි සුසාන :- භෂ්මාශේෂ සහිත කුඩා මැටි බඳුන් විශාල මැටි බඳුනක් තුළ දමා තැන්පත් කිරීම.
- මැටි ඔරු සුසාන :- ඔරුවක හැඩැති බෙසමක භෂ්මාවශේෂ බහාලූ මැටි වලක් තැන්පත් කිරීම මේ තුළ ඇටසැකිලිද ආදාහනය කර ඇත. (උදාහරණ - බෙරගල, හල්දුම්මුල්ල) (මෙයින් 02 ක් විස්තර කර තිබීමට (ල.05)

(iv) වර්ෂාපතනය / පසේ ස්වභාවය (රතු දුඹුරු පස) / භූ විෂමතාව / ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය / ජලවහනය (මින් 02 ක් පැහැදිලි කරන්න ල.06)

(03) (i) A - කොක්ගල් කන්ද B - පෙරියපුලියන් කුලම C - කළුදිය පොකුණ (ල.03)

(ii) A - පළමුවන ගජබා B - හයවන අග්ගබෝධි C - සිව්වන කාශ්‍යප D - පළමුවන උපතිස්ස (ල.04)

(iii)
- චෝල පාලකයෝ රට මුදාගෙන රට නැවත එක්සත් කිරීම.
- බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.
- ත්‍රිකුණාමල වරායේ වෙළඳ කටයුතු පහසුවෙන් කිරීමේ අරමුණින් පොලොන්නරුව රාජධානිය ලෙස තෝරා ගැනීම. (මින් 02 ක් පැහැදිලි කිරීම) (ල.05)

(iv)
- දෙමළ ජාතික භික්ෂූන් වහන්සේ නමක් පිළිබඳ අනුරපුරයේ අභයගිරි විහාරයෙන් සොයාගත් සෙල්ලිපියෙන් සොයා ගැනීම.
- අම්පාර දිස්ත්‍රික්කයෙන් සොයාගත් සෙල්ලිපියකට අනුව සිංහල කාන්තාවක් දෙමළ ජාතික පුරුෂයකු සමඟ විවාහ වීම.
- ඉන්දියානු සාගර අවට කලාපයේ පිහිටි විවිධ රටවල් වලින් පැමිණි වෙළෙන්දන් ශ්‍රී ලංකාවේ ජීවත් වීම.
- දෙමළ අධිකාරි පඬිරද් නැමැත්තකු සිව්වන කාශ්‍යප රජුගේ සෙල්ලිපියක සටහන් වීම.
- ඉලනාග හා අභයනාග රජු දකුණු ඉන්දීය සේවායන්ගේ උදව් ගැනීම.
- පළමුවන විජයබාහු රජුගේ කාලයේ දළදා මාලිගයේ ආරක්ෂාව සඳහා වේලෙක්කාර් හමුදාවක් සිටීම. (ආදී තොරතුරු විස්තර කරන්න. පිටු අංක 61) (ල.06)

(04) (i) A - පණ්ඩුකාභය B - මහසෙන් C - ධාතුසේන (ල.03)

(ii) A - ඇලහැර ඇළ B - යෝධ ඇළ C - මිනිපේ ඇළ D - ඌරා කැට ළිං (ල.04)

(iii)
- වැවේ කොටස් ඇසුරින් විස්තර කිරීම (වැව් බැම්ම, බිසෝකොටුව, රළපනාව, පිටවාන, සොරොව්ව)
- ඇළ මාර්ග ඉදිකිරීමේ තාක්ෂණය ඇසුරින් විස්තර කිරීම.
- සීගිරි ජල මල් ඇසුරින් යොදාගත් තාක්ෂණය.
- ඌරා කැට ළිං ඇසුරින් පැහැදිලි කිරීම. (ල.05)

(iv)
- තුන්වන උදය - බුද්ධන්නේහෙල සෙල්ලිපිය - කැලෑවල ගස් කොළස් නොකැපිය යුතු බව.
- පස්වන කාශ්‍යප - කොණ්ඩවට්ටවාන් ලිපිය - ගස් කොළන් කළමනාකරණයට රජයට පැනවූ නීති පිළිගත යුතු බව.
- අමණ්ඩ ගාමිණී රජු - සතුන් ආරක්ෂා කිරීම පිළිබඳ නීති පැනවීම නිසි කලට සී සෑම පිළිබඳ කොණ්ඩවට්ටවාන් සෙල්ලිපියේ දක්වා තිබීම. (ල.06)

(05) (i) A - දෙවන පැරකුම් රජතුමා   B - පළමුවන බුවනෙක රජතුමා   C - හයවන පැරකුම් රජතුමා (ල.03)

(ii) A. දඹදෙනි කතිකාවත   B. කඳවුරු සිරිත (ල.04)

(iii)
- කෘෂි කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය වීම හා තෙත් කලාපයේ වාරි කර්මාන්ත අවශ්‍ය නොවූ නිසා අහස් දියෙන් වගා කිරීම.
- ජල හිඟ ප්‍රදේශ වල හේන් වගාව දක්නට ලැබීම.
- ආහාර බෝග වල අතිරික්තය වෙළඳාමට යොදා ගැනීම නිසා විදේශ වෙළඳාම දියුණු වීම.
- තෙත් කලාපයේ වනගතව වැවුණු කුරුඳු ආදී ද්‍රව්‍ය අපනයනය කිරීම.
- ඉන්දියාව අරාබිය, චීනය, පර්සියාව, ඊජිප්තුව වැනි රටවල් සමඟ වෙළඳාම. (ල.05)

(iv)
- උගත් පඬිවරු බිහිවීම - තොටගමුවේ රාහුල හිමි, කැරගල වනරතන හිමි, සාහිත්‍ය දියුණුවට රජවරුන්ගේ අනුග්‍රහය ලැබීම. VI පරාක්‍රමබාහු රජු
- අධ්‍යාපන මධ්‍යස්ථාන බිහිවීම - පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන, කැරගල පද්මාවතී පිරිවෙන, දෙවිනුවර ඉරුගල්කුලතිලක පිරිවෙන
- ග්‍රන්ථ බිහිවීම - භක්ති කාව්‍ය, ශිලෝකාව්‍ය, හටන් කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය උපදේශ කාව්‍ය, කෝෂ ග්‍රන්ථ බිහිවීම (ල.06)

(06) (i)
- වැදගත් නායකයන් සම්බන්ධ නඩු
- කැරලි කෝලාහල පිළිබඳ නඩු
- කුමන්ත්‍රණ නඩු
- රාජද්‍රෝහිත්වය පිළිබඳ නඩු
- විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු (කැමති 03 ක් නම් කිරීමට ල.03)

(ii) A - මඩිගෙ බද්ද   B - කුරුවේ බද්ද   C - හැඳ බද්ද   D - බඩහැල බද්ද (ල.04)

(iii)
- පෘතුගීසීන්ගෙන් උඩරටට එල්ලවන අභියෝග වැලැක්වීම.
- පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම.
- උඩරට රදල ප්‍රදානීන්ගෙන් එල්ල වූ තර්ජන අවම කිරීම.
- ලන්දේසි බලපෑමෙන් රට නිදහස් කර ගැනීම. (මින් 02 ක් විස්තර කරන්න - පිටුව 109) (ල.05)

(iv)
- උඩරට ජනතාව හැම විටම රජුට සහය වීම.
- පෘතුගීසීන් වෙනුවෙන් සටන් කිරීමට ගිය පහතරටියන් උඩරටදී රජුට එකතු වීම.
- උඩරටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞශල්‍යය.
- උඩරට රාජධානියේ ස්වාභාවික පිහිටීම. (මින් කරුණු 03 ක් විස්තර කිරීම.) (ල.06)

(07) (i)
- වෙළඳ සමාගම් පාලනය
- ද්විත්ව පාලනය
- කිරීට පාලනය (ල.03)

(ii) A - කෝල්බෲක් ප්‍රතිසංස්කරණය   B - ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

C - 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව   D - 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (ල.04)

(iii)
- 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය මගින් එක් පුද්ගලයෙකුට අයිතිය තබාගත හැකි ඉඩම් ප්‍රමාණය නියම කිරීම. (උදාහරණ - වී වගාවට හෙක්ටයාර් 10, වෙනත් බෝග සඳහා හෙක්ටයාර් 20)
- 1975 ඉඩම් ප්‍රතිසංස්කරණය මගින් ව්‍යාපාර වතු වගාවේ යෙදෙන සමාගම් සතු ඉඩම් ජනසතු කිරීම. පොදු සමාගම් සතු ඉඩම්වලින් 62% ක් රාජ්‍ය අංශයට අයිතිවීම. රාජ්‍ය අංශයට අයත් වූ ඉඩම් වලින් 10% ක් කුඩා බිම් කොටස් ලෙස ගොවියන් අතර බෙදා දීම. (ල.05)

(iv)
- ග්‍රාමීය සෞඛ්‍ය දියුණු කිරීම : ග්‍රාමීය රෝහල් පිහිටුවීම / වින්නඹු මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා දියුණු කිරීම / ප්‍රතිශක්ති කරන එන්නත් ලබාදීම / වෛද්‍ය සායන පැවැත්වීම / දේශීය වෛද්‍ය ක්‍රම දියුණු කිරීම / බරවා, මැලේරියා...., පක්ෂගාත රෝග පාලනය
- වෙනත් ශුභසාධන : මාර්ග පහසුකම් දියුණු කිරීම, දරිද්‍රතාව අවම කිරීමට සහල් සහනාධාරය දියුණු කිරීම, සහනාධාර දෙන සෑම අයකුටම කුපන් පොතක් දීම, නිවාස ගැටළුව විසඳීම සඳහා නගරයත් තට්ටු නිවාසත් ග්‍රාමීය ප්‍රදේශවල නිවාස යෝජනා ක්‍රමත් ආරම්භ කිරීම. ග්‍රාමීය ප්‍රදේශ වල අධ්‍යාපනය දියුණු කිරීම. (ල.06)

## III - කොටස

(08) (i) A - පේෂ කර්මාන්තය B - යකඩ හා වානේ කර්මාන්තය C - ගල් අඟුරු කර්මාන්තය (ල.03)

(ii) A - ඉඩම් කොටු කිරීම B - ජේත් රොටල් විසින් පේළියට බීජ වැපිරීමේ ක්‍රම

C - රොබට් බැක්වෙල්ගේ බැටළු අභිජනනය D - ගුවානෝ පොහොර නිෂ්පාදනය (ල.04)

(iii)
- යහපත් නගර බිහිවීම, රැකියා බිහිවීම, ජීවන තත්වය දියුණු වීම, දෛනික වැඩ පහසුවීම
- අයහපත් පරිසර දූෂණය, ධනවත් නිර්ධන පංති බිහිවීම, ළමා ශ්‍රමිකයන් බිහිවීම, ඔරොත්තු නොදෙන ලෙස ජනාකීර්ණවීම, මුඩුක්කු බිහිවීම, අපචාර බහුලවීම (ල.04)

(iv) A - වතු වගාව :- පෙඩ්රික් නෝර්ත්ගේ කෝපි කෙටිමේ මෝලක් ආරම්භ කිරීම. තේ, රබර් පිටරට යැවීමට යන්ත්‍රය සැකසීම.

B - ප්‍රවාහනය :- වැඩවසම් ක්‍රමය භාවිතය, දුම්රිය මාර්ග - කොළඹ සිට මහනුර දක්වා, මහාමාර්ග - කොළඹ සිට මහනුවර ආදී මාර්ග, ජල මාර්ග හරහා ලී පාඩම් වෙනුවට යකඩ පාලම්

C - තැපැල් සේවය :- අශ්ව කරත්ත මගින් තැපැල් සේවය, 1857 තැපැල් මුද්දරය නිකුත් කිරීම, තැපැල් කාර්යාල පිහිටුවීම, ටෙලිග්‍රෑම් ක්‍රමය ආරම්භවීම (ල.06)

(09) (i) බ්‍රිතාන්‍යය / ප්‍රංශය / රුසියාව (ල.03)

(ii) A - ලොයිඩ් ජෝර්ජ් B - ඉතාලිය

C - ඩිච් ආච් ප්‍රාන්ස් පර්ඩිනන්ඩ් D - ලුසිටානියා (ල.04)

(iii)
- ජාතීන්ගේ සංගමය බිහිවීම
- මධ්‍ය බලවතුන් පරාජයවී මිත්‍ර බලවතුන් ජය ලැබීම.
- ජීවිත හා දේපල හානි සිදුවීම
- වර්සල්ස් ගිවිසුම මගින් ජර්මනිය වූදිතයා වීම පැහැදිලි කරන්න. (ල.05)

(iv)
- සූවස් අර්බුදය විසඳීම
- කියුබානු මිසයිල අර්බුද විසඳීම
- ගල්ෆ් අර්බුදය විසඳීම (ල.06)


N


N